SUBHÂSITA

BY

ALAGIYAWANNA MOHOTTALA.

WITH

A PARAPHRASE

BY

P. RAMACHANDRA.

සු භා ෂි ත ය.

අලගියවන්න මොහොට්ටාලහාමිත් විසින්
වි ර චි ත යි.

පියදාස රාමචන්ද්‍ර ගුරුතැන විසින්
ලි ය න ලද
භාවසන්න සහිතයි.

ශී. බොනේජු විසින්
කොළඹ කවිවේරිය ඉදිරිපිට
සරස්වතී යන්ත්‍රාලයෙහි
මු ද්‍රි ත යි.

1908.

සඥාපනය.

දෙවෙනි රාජසිංහ රජු දවස යථොක්ත රජතුමන්ගෙන් හා ඕලන්ද ආණ්ඩුවෙන් ද ගරු බුහුමුන් ලබා හිස්වැල්ල නම් ගම් වරය නින්දගම් කොට ඇතිව මුකවෙට්ටි නිලය ද දරමින් අනුභව වූ යශසෛශ්වර්‍යයෙන් සුක්ත ව ලක්දිව අසහාය කාව්‍ය කාර ව විසූ අලගියවන්න නම් පණ්ඩිතුමා විසින් සංස්කෘත ද්‍රවිඩ නීතිශාස්ත්‍රානුකූල ග්‍රන්ථයන්ගෙන් සාරවත් කරුණු උපුටා සිංහල කාව්‍යයට නගා රචනා කරන ලද මේ සුභාෂිතය අප බාල ජනයාහට අතිශය ඵලදායී ව පවත්නේය.

මෙය ඉගෙනීමෙන් නීතිශාස්ත්‍රය පිළිබඳ වූ වචිනා බොහෝ උපදෙශයන් නිරායාසයෙන් දැන ගැනීම හා ඒ ඒ උපදෙස් වාචොදගත වීමෙන් අභ්‍යස්තානෙරන්තයර්‍යය ද ලැබෙන්නේය. උපමානොපමෙයයන් දැන ගැනීමෙන් හා ස්ථානොචිත පරිදි ඒ යොදා දැක්වීමෙහි පටුත්වය ඇති වීමෙන් සහාරසඥනයෙහි වාක්‍යෞඝ ශල්‍යය ද ඇති වේ.

1. සිංහල කාව්‍යයන්ට ගුරුසන්නිධියෙහි අර්ථ ඇස්වීමෙන් කාව්‍යභාෂා විජ්ඤානය ඇති වන්නා හා සමග ම මිශ්‍ර සිංහල භාෂායෙහි නිපුණ බව ද ගෙන දෙයි. ඒ කාව්‍යයාගේ භාව සන්නයක් ඇති වීමෙන් ගුරු මුඛයෙන් ලැබූ උදග්‍රහණය පිළිබඳ අර්ථ සුගමයද වේ.

2. සිංහල කාව්‍යයන්ට අර්ථ කියන පරිදි මද දුරක් වත් දැන ගත් ශිෂ්‍යයන්ට භාව සන්නයෙන් ඒ ඒ කාව්‍යයේ අදහස් තේරුම් ගත් කල තදනුක්‍රමයෙන් පදාර්ථය යොදා ගෙන තනිව ම පදාර්ථ කීම ප්‍රගුණ කර ගත හැකි වෙයි.

3. පාඨශාලාවල සමහර ගුරු වරු මෙබඳු පොත් උගන්වන කල පදගතාර්ථ නො කියවා ම අදහස් තේරා දීම පමණින් උගන්වති. එසේ ඉගෙනීමට නම් මනාසේ ලියන ලද භාව සන්නයක් ඇති කල ගුරුවරයෙක් නැතිව ම අර්ථාවබොධය කර ගත හැකි වෙයි. (ඒ ක්‍රමය නො මනා බව දත යුතුයි. පදගතාර්ථ කීමෙහි චාතුර්‍යයක් ඇතිව ම භාවාර්ථ දැනීමෙහි දක්ෂ වී නම් ඒ ම සම්භාවනීය වෙයි.)

4. සුභාෂිත කාව්‍යය වාචොදගත කොට ගනිමින් එහි අදහස් දැන ගැනීමට ආසා ඇති සාමාන්‍ය ජනයා ද පෙර සිට ම ඇත්තේය. භාව සන්නයක් ඇති වීම ඔවුන්ට අතිශයොපකාරී වෙයි.

මේ සතර ආකරයෙන් ම ප්‍රයොජන වන පරිද්දෙන් අපගේ මේ භාව සන්නය සුභාෂිත ටීකාවක් සේ ලියන ලදී.

අනුන්ගේ පදගතාර්ථ සන්නයකින් එලු පද බැහැර කොට අර්ථ පද පමණක් ගෙන දැක්වීම භාව සන්නයයි කියමින් මෑතක පටන් එබඳු සන්න ප්‍රසිද්ධ කරන බව පෙනේ. භාව සන්නයෙන් කවියෙහි භාවය හෙවත් අදහස දැක්විය යුතු ම බැවින් පදාර්ථ ලිවීමට වඩා ඒ දුෂ්කරය. සමහර විට භාවාර්ථය නො දැනත් පදාර්ථ කිය හැකි වෙයි. එ බැවින් අපගේ මේ උත්සාහය ආධුනික ජනයාගේ හා ගුරු වරුන්ගේ ද පහසුව පිණිස වේයයි විශ්වාස කරමිහ.

මෙකල මුද්‍රිතව තිබෙන සුභාෂිත පොත්වල අයථාර්ථයන් දක්නා ලද බැවින් මෙහි සමහර තැනෙක ඒ සඳහා අධොලිපි දයෙදිය යුතු විය. සමහර කවිද වරදවා තිබී යථාස්ථානයෙහි තැබීමු. සම්පූර්ණ කවි පද පවා මාරු කොට හැම කල් ම මුද්‍රණය කර ගෙන ආවෝය. නො සැලකීමෙන් ඇති වී තිබෙන මුද්‍රණ දෝෂ නිසා ඒ අභිශීලනය කරන්නවුන්ට බොහෝ වෙහෙස ගෙන දෙයි. තවද "කෝසේ ද යත්, කුමක් හෙයින් ද යත්" යනාදිය ඇතිව මුද්‍රිත වූ අන්‍ය වූත් සියලු ම පොත් වල ප්‍රශ්න සඛ්‍යාතය (ඇහිමේ ලකුණ) යෙදා තිබෙන නුමුත් මෙහි අප විසින් එය අසම්භාවනීය ක්‍රියාවයයි සලකන ලදී. මුද්‍රණය පිළිබඳවූ සලකුණු යෙදීම් වචන වෙන් කිරීම් ආදී බොහෝ කරුණුවලින් අපගේ අධික සැලකීම මෙහි දක්නා ලැබේ. එනකුදු වුවත් (1) සෙවුනා ලද්දවූ, (4) ස්කන්ද කුමාර, (24) රජක්හුගේ, දුක් නමැති අඹුකාරය, (29) ක්ෂෙත්‍ර වාසතුන්, (30) සම්පත්ත්‍යසහනතායෙන්, (36) දුර්ජන යෝ, නාගයන් මෙන්, භය එළවත්, (44) නාරිකෙල, (53) කුමුදවනයාගේ යනාදිය සලකා ගත යුතුයි.

තවද කොළඹ වේල්ල වීදියේ නොම්බර 32 දරන සරස්වතී පුස්තක මන්දිරය හිමි අප මිත්‍ර සී. බොතේජු මහත්මයාගේ ආරාධනායෙන් ලියන ලද මේ සන්නය යථොක්ත මහත්මයාගේ ධාර්මික පොත් වෙළඳමට උපකාර පිණිස මේ වර පොත් 2000 ක් මුද්‍රණය කර ගැනීමට නොම්ලයේ දෙන ලදී. මින් පසු මෙය මුද්‍රණය කිරීමේ බලය සන්න කතීතාහට ම තබා ගත් බව දත යුතුයි.

P. Ramachandra,
Govt: School Master

1908 ජනවාරි 3 දිනදීය.

6 එ බැ වි න් සෙබෙහි වියතිනි ගුණයුත් පව ර
කි රි යෙ න් දියර වෙන්කළ හස මෙන් පත ර
ම වි සි න් කියන මෙහි වරදක් දුටත් හැ ර
සඳනොසි න් අසව් පදරුත් විමසා ගැඹ ර

එසේ පද්‍ය රචනා මුඛයෙන් සැකෙවින් කියන බැවින් කරුණා ගුණයුත් පණ්ඩිතයෙනි මේ රචනායෙහි දෙෂාංශුවකු දක්නා ලදද ඒ බැහැර කොට නීතිශාස්ත්‍රය පිළිබඳ ගම්භීරවූ ශුඩපදාර්ථ යන්ම පරීක්ෂා කොට භජනය කරව්.

ජලයෙන් සම්මිශ්‍රවූ කිර රාජ හංසයාහට ලැබුන කල්හි ජලය ඉතිරිකොට ක්ෂීරය පමණක් පානය කෙරෙයි, එමෙනි.

7 ප බ ඳ කිවින් බැඳි කවරසෙහි විසිතු රැ
ස බ ඳ විදුදනෝ පළ කෙරෙති දියතු රැ
නොමඳ රසින් දිවයුරු පොබයයි නඹු රැ
සු ව ඳ දිගත විහිදයි හමන මදම රැ

මෙහි ලා බැඳි කාව්‍ය රසය පණ්ඩිත ජනයාවිසින් ලොව පළ කිරීම ධර්මතා බැව් කිහ.

8 කි වි ප ද බැදුම් ගුණදෙස කිවිදෝම මි ස
නැණ ම ඳ කුකවි දැන ගත හෙති කවර ලෙ ස
ද රැ ල ද අහනෝම මිස පසවෙහි වෙහෙ ස
ව ඳ ළ ද ගනෝ දැන ගත හෙති කවරලෙ ස

කාව්‍ය බන්ධනයාගේ ගුණ දෙෂ පරිඥනය කුතසිත කවින්ට හෙවත් පණ්ඩිත මානි අවිඥයන්ටද, ප්‍රසව පරිශ්‍රමයාගේ ප්‍රමාණය දැනීම වන්ධ්‍යා බාලිකා දෙදෙනාටද අවිෂය වෙයි යනු භාවයි.

9 උ තු ම් නිවන් සැප සපයාදෙන මහ ත
ද හ ම් රජ සමය නොගනිති කුදිටු ස ත
නොගිම් සුවඳ විහිදෙන සිරි රැඳි දිමු ත
පි යු ම් වෙනෙහි නිලමැසි කැල නොහැසිරෙ ත

"දහම් රජ" නම් බුදුහුය. "පියුම්වන" ශබ්දයෙන් නෙලුම් විල කියන්. "කුදිටු සත" යනු මිථ්‍යා දෘෂ්ටික සත්වයෝයි බහවර්ණ කොට දතයුතුයි. තකාරාන්ත "සත්" ශබ්දයා හට අප්‍රත්‍යය කළහ. "කැල" යනු සියරෑ නොහළ අවිදුමන් විදියෙහිවේ, ප්‍රථමා බහු වචනයි.

10 රු ව න් මිල නොදත් අනුවණ දන වෙළ් ද
මලාබි න් කදමැටි මිණියයි රැගත් ලෙ ද
ප ස න් මුනිවරන් හැර අන් සුරන් වැ දී
නි ව න් පතා අනුවණ සත කරන ලෙ ද

මෙහි "කදමැටි" ශබ්දයෙන් කාච මාණික්‍යය ආභරණාදිහු කියනු ලැබෙත්, විදුරු මෙන් දීප්තිමත් නොඅගනා මැටියෙන් කර හ ලදුයි. "නිවන්" නම් විමුක්තියි, සමයානන්තරයෙහි වනාහි සංඛ්‍ය දී ශබ්දයෝද තත්තාදර්ශියෝද සලකනු ලැබෙත්.

11 න ඳ න මුනිඳු හැර අන් සුරනට පැව ත
නි ව න පතා අනුවණ සත කරන තැ ත
ල බ න පිණිස තෙල් ලොබවඩවමින් සි ත
ම ඕ න වැන්න වැලිමලු ලමිනි තෙලිය ත

"තෙලියත" නම් තල ආදියෙන් තෙල් පැහැර ගන්නා පිණිස යොදන යන්ත්‍රයයි. 1තල පැස තෙලියතෙහි ලා මඕන කල තල තෙල් වැහෙයි. මි එරඬු ආදියද එසෙයි. තෙලියතෙහි වැලි පැස් ලා මඕනු නිරර්ථක බැව් මෙහි උපමා කොට කියන ලදී.

12 ස ක ල සුර නරන් මුදුනතැ සැදූ ප ද
වි පු ල මුනිසරණ හැර අන් සුරන් වැ ද
නි ම ල මොක් පිණිස සත රකිනා දුල ද
දි ඹු ල මල නිසා වෙහෙසුණු වැනි දියැ ද

සියලු දෙව් මිනිසුන් විසින් වඳනා ලබන පා ඇති බුදුන් සරණ (පිහිට) කොට යාම තබා අන්‍යවූ දෙවියන් සරණ යාම් වශ යෙන් වඳිමින් නිවන් පිණිස පවත්වන මිථ්‍යා ලබධිය යෙබඳුදැයි යතහොත් අව්වික්කා මල් ලබනු පිණිස දිය ඇදිමෙන් වෙහෙස ගැනීමක් මෙන් නිරර්ථකය.

අන්තර්භූත පුෂ්ප සමූහය ඵල රූපයෙන් දක්නා ලබන බැවින් උදුම්බර වෘක්ෂය අපුෂ්ප ඵලවත් වනස්පතියෙකැයි ලොක සම්මතියි.

---

1 "පැහේවැලි මලු දමමින්" කියා සමහර කෙනෙක් වරදවා සන්න ලියති. වැලි මලුද වැලි පැස්ම වෙත්.

13 පු න් පිරිසිදු සිල්මුල් ගුණකඳින් යු නි
ද න් කම නැණ කුරු මල් සාමඬුලු ඇ නි
පි න් කප්තුරු සගමොක්ඵල දෙන කැම නි
ම න් සුදනන් මෙත්සිලිලෙන් වැඩෙයි නි

අනුනවූ නිර්මල ශීල නමැති මුල් ඇත්තාවූ, සදගුණ නමැති සකඬයෙන් යුක්තවූ, දාන නමැති අඬකුර ඇත්තාවූ, ක්ෂමා නමැති මල් ඇත්තාවූ, ඥාන නමැති ශාඛා මණ්ඩල ඇත්තාවූ, අභිප්‍රෙත සවගී මොක්ෂ නමැති ඵල දෙන්නාවූ, පුණ්‍ය නමැති කල්ප වෘක්ෂය තෙම සත්පුරුෂයන්ගේ සිත්හි මෛත්‍රී නමැති ජලයෙන් සතුන යෙන් වර්ධන වෙයි.

14 පි ය ක ර සතර බඹ විහරණ සිව් පෙදෙ නි
වැර සැර නැණ යුවල දළ දිලි දම් සොඬ නි
පු ව ත ර තුමුල මත වරණිදුට නැගෙම් නි
ම න හ ර සෙත් පුරට පැමිණෙව් සව සතු නි

සකල සත්වයෙනි (මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ෂා සඞ්ඛ්‍යාත) ප්‍රියංකරවූ චතුර්විධ බ්‍රහ්ම විහරණ නමැති සිව් පා ඇති, වීරසාර ගුණය හා ඥානය නමැති දෙදළ ඇති, ධර්ම නමැති සොඬ ඇති, ප්‍රසිද්ධවූ මහත්වූ හස්තිරාජයාට නැඟී මනඃ ප්‍රසාදකර නිර්වාණ නමැති නගරයට පැමිණෙව්.

15 නි දෙ ස් ගුණබරණ සදහම් කිරුළු ද රා
වෙ සෙ ස් සිල් සෙනහ ගෙනැ මෙත් තුරඟ අ රා
කෙ ලෙ ස් රුසුන් සිඳ නැණ කඟිනි නොම හැ රා
ස තො ස් රජසිරින් පැමිණෙව් නිවන්පු රා

නිර්දෝෂ ගුණාභරණයන් පැලඳ, සද්ධර්ම කිරීටය දරා, උතුම් සිල් සෙනහ ගෙන, මෛත්‍රී නමැති අසු නැඟී, මාර්ගඥාන නමැති කඩුවෙන්, කෙලෙස් සතුරන් මුල් සුන් කොට රජකු සෙයින් සතුටුවෙන් නිවන්පුර පැමිණෙව්.

16 ඇ ත ත් නැතත් පරලොව සුදනෙනි මහ ත
හ ලො ත් යෙහෙකි පව්කම් නොතබාම සි ත
නැ තො ත් එපරලොව ඉන්වන අවැඩ නැ ත
ඇ තො ත් නැතැයි පව්කළහට වෙයි විප ත

චාරිත්‍ර ශීලයට වඩා චාරිත්‍ර ශීලය රක්ෂා කිරීම පහසුයි, එ හෙයින් අවැඩ නැතැයි මෙසේ කියනලදී. නාස්තිකයා පාප ක්‍රියා වේන් විපතට පැමිණෙයි.

17 දැ හෙ ත ත් අවරගිරිගින් දිනකර මඬ ළ
පි පෙ ත ත් ගිරිමුදුනැ හෙල්මැලි පියුමුපු ළ
සැ ලෙ ත ත් සුනෙර පවනින් සෙදෙනත් අන ළ
බොරු නැ ත් නෙමය මහතුන් පැවසූ තෙපු ළ

සයිමණ්ඩලය අර්ධ පර්වතයෙන් උදගත වෙනත් කලහාර පද්මොත්පලයන් කඳු මුදුනෙහි පිපෙනත්, මහමෙර සුලඟින් සැලෙනත්, ගින්න නෙත් ගුණ ඇති වෙනත්, මහොත්තමයන් කි බස බොරු නොවේයි. කිසිකලෙකත් උත්තමයා බොරු නොකියයි කි ලේයි. (හෙල්මැලි නම් මිලු වගීයකි, ගස මුලින් නොව දඬඅග පත්‍ර සමීපයෙන් මල්නටු ඇතිව ඉතා සුකුමාරවූ ශුභවර්ණවූ කුඩාමල් පිපෙයි. "සෙදෙන" යනු සෙදයන ධාතුවෙන් සිඩ අසමභාවනිය ක්‍රියායි.

18 පි රි වා ර සෙ න් රකිනා පිණිස නිරතු රැ
පෙර නි ය මි න් නිරිදෝ රැගනිති පඬු රැ
සිසගුණ යෙ න් වසිනා වැසි මෙදියතු රැ
සිය කි ර ණි න් දෙරණත රස ගනිය හි රැ

බොහෝ සෙයින් වසින්නාවූ වැසි ඇති මේ ජගදභ්‍යන්තර යෙහි පෘථිවිරසය සූර්‍ය්‍ය තෙමේ ස්වකීය රශ්මියෙන් ඇදගන්නේය. නිරන්තරයෙන් පරිවාර සෙනාව රක්නා පිණිස පූර්ව නියමය නො පිරිණහළා (ධාර්ම්මික) නරෙන්ද්‍රයෝ (එසේම) අයබදු ගනිත්.

19 කෙ නෙ ක් වෙහෙස ලදුවත් සුදනෝ පව ර
උ ද ක් ලොව සතුන් සිතැ දුක් කෙරෙති දු ර
ප ස ක් රහු මුව පත්වමිනි බියක ර
අ නි ක් පසින් ලොව හෙළිකෙරෙය හිමක ර

එක් පාර්ශ්වයකින් රාහු මුඛයටපත් චන්ද්‍රයා අනික් පාර්ශ්වයෙන් ලොව හෙළි කරන්නාක් මෙන් සත්පුරුෂයෝ තමන්ගේ විපත් සම්පත් නොසලකා එකාන්තයෙන් ලොක සත්වයාහටම පිහිට වෙති,

20 පි න් ම ඳ පු තු න් සියයක් ලදුවත් නිස රැ
ගුණනැණ බෙලෙන් යුතු පුතුමය ඉනා ග රැ
එ ක පු න් ස දි න් දුරුවෙයි ලොව ගන අඳු රැ
නෙ කත රු රැ සි න් එලෙසට නොම වේය දු රැ

පින් මඳ පුතුන් තරු රැසට ද ගුණ නුවණ බලයෙන් යුත් පුත්‍රයා අඳුරු නසන අසහාය චන්ද්‍රයාට ද සමාන කොට කියන ලදි. ("නිසරු" යනු පුතුන් ගන්නට විශෙෂණයි.)

21 වි පු ල නැණැති මහතුන්හට පත් විප ත
න්ස ල නැණින් යුතු උතුමෝ ම දුරල ත
කල ල ගිලුණු මතවරණිදු ගොඩ ගනු ත
තු මු ල බලැති ගිජිදකු මිස අන් කෙව ත

මහතුන්ට පැමිණි විපතින් ඔවුන් මුදා ලන්ට දුර්ජනයෝ සමර්ථ නොවෙති.

22 කුලුණු ගුණෙන් යුතු උතුමන් සිත මහ රු
දු ද න ඛ සි න් නොයෙදෙයි කරනට නපු රු
නව රු ව නි න් පිරි මහ සමුදුර ගැඹු රු
තණ සු ල කි න් හුණුකළි හැකි වෙද කවු රු

කරුණා ගුණයෙන් යුක්තවූ උත්තමයන්ගේ සිත වෙණ දුණ්ණාදියෙන් කිලුටු කරන්ට දුර්ජනයෝ අසමර්ථයෝයි.

23 සු ර තු රු ව න් උතුමකු දෙන දනින් මි ස
ය දි ක ලි ම න් කෙසෙ දුරුවෙද මුලින් පි ස
ම හ මෙ ය කි න් පහ වන ගතෙහි සරතැ ස
පි නි බි ඳ කි න් වැළකිය හැකිවෙද කෙලෙ ස

සුරතුරු නම් ප්‍රාර්ථිත යාචිත සියලු වසතු දෙන දිව්‍ය වෘක්ෂයෝයි. එබඳු ගුණ ඇති උත්තමයන් විසින්ම මිස අනිකකු විසින් යාචකයාගේ ලොභ චෙතනාව අවශෙෂයෙන් දුරු නොකට හැක්කේය. මහා මෙඝයකින් දුරුකටයුතු ශරීර ශ්‍රාන්තය පිනි බිඳකින් දුරුනොවෙයි.

24 දි ය නෙ ත උදා වන සියකිරණින් මහ රු
මෙ දි ය ත දිවා බිහි දුරු වෙයි ගනඳු රු
සි රි ව ත රජ තුමකු දුටු පමණින් සොඳු රු
ඇ තු ළ ත පිටත දිව රැ හැරෙය දුකඳු රු

සඵ පදාර්ථයන් දක්වන බැවින් ලොකයාගේ ඇස් වැහිවූ සූර්‍යයා දහවල් පමණක් හුදු බහිර්භාගයෙහිම අඳුරු දුරලයි. ධාර්මික රජහුගේ ශ්‍රී වක්‍රය දුටු පමණින් බහිර්භාගයෙහි ම නොව අන්තර්භාගයෙහි ද හුදු දිවා භාගයෙහි ම නොව රාත්‍රි භාගයෙහි ද ලොකයාගේ අන්ධකාරය දුරුවෙයි. ("මහරු" යනු දියනෙත යන්නට විශෙෂණයි. සිය කිරණින් යනු වෙන්ද දියනෙත උපලක්ෂිතයි.)

25 කු ලු ණෙ න් ගුණෙන් නුවණින් පසිඳු හැම තැ න
සු ද න න් සෙවුන නිරිඳෝ ලෙවසත රකි න
දෙ හි රු න් මලින් රොන් ගෙන යන මෙන් සෙම් න
නි ය මි න් අය ගනිති සත සිත නොතළම් න

සත්පුරුෂයන් විසින් සෙවුනා ලද නරෙන්ද්‍රයෝ මල නොතළා රොන් ගන්නා බමරුන් සෙයින් දෙශ වාසීන්ගේ සිත් නොතිළා පෙර නියම පරිදි අය පඬුරු ගනිති. ("පසිඳු" යනු සුදානම් යන්නට විශෙෂණයි. රෙළුවයකගේ ශබ්ද ඇති බැවින් "ළිරෙළු" යි බමරුන්ට නමෙකි.)

26 අ ම යු ත් රස අහර වත් වඩවන ඔද ස
කු සැ ග ත් ගිනි නිවන පමණට බුදිත ලෙ ස
නෙ ද කි ත් පතළ නිරිඳෝ නොමඳ දන රැ ස
නොකෙරෙත් ලොව සතුන් රකිනා විතර ම් ස

දිව්‍ය භෝජනය මෙන් රසවත් වූයේ නමුත් ශරීරයාගේ ඔජස් වඩන කරන සුළු වීනමුත් නුවණැත්තෝ ජඨරාග්නිය සන්සිඳුවන පමණ දැනම ආහාර ගනිති. එමෙන් ධාර්ම්මික නරෙන්ද්‍රයෝ ලොක සත්වයන් පාලනය කරන ප්‍රමාණයට මිස අප්‍රමාණයෙන් ධන සඤ්චය නොකෙරෙත්.

27 පැ ණ ස ර නොවන නිරිඳුන් ලද රජ සැ ප ත
ගොරත ර නිරුදකටත් වැඩියෙන් වි ප ත
නි ර ස ර නැණැති නරවර ලද එම සැ ප ත
සු ර පු ර සැපතටත් සියගුණෙනි යහ ප ත

අපණ්ඩිත රජතෙමේ කටයුතු නොකටයුතු නොදත් බැවින් මහදුක් අනුභව කෙරෙයි. මෙනම් කර්ම්යෙකින් මෙනම් ඵලයෙක් උපදියි කියා දන්නා පණ්ඩිත රජ වූකලි අපමණ සැපයෙන් රජය කෙරෙයි.

28 බැ ලු මෙ න් සිහි කිරීමෙන් පහසින් නිති ත
ස සු ත න් රකින මින් කුමු සියොතුන් ලෙසි ත
කු ලු ණෙ න් ගුණ නැණින් යුතු උතුමෝ සොබ ත
වෙ සෙ සි න් ලොව සතන් රැක පවතිත් තොසි ත

තමන්ගේ බිජුවට වසන දරුවන් පොෂණය පිණිස මනස්‍යයා වරින් වර පැමිණ ඒ තමන් විසින් ගෙලා තැන්පත් කළ බිජුවට අවලොකනය කෙරෙයි. කුම්භීයා හෙවත් ඉදිබුවා බිජුවට සිහිකෙරේ. පක්ෂියා බිජුපිට හිඳ සපෂී කෙරෙයි. එමෙන් කරුණාවෙන්ද සද් ගුණයෙන්ද ඥානයෙන්ද යුක්තවූ උත්තමයෝ ලොක සත්වයන් වර්ධන කෙරෙත්.

29 ස ම ව ත වැසි සුළඟ කෙත් වත් වැවෙන මෙ ත
ලොව ස ත රැකෙයි නිසි රජ නැණැති මැතිගෙ ත
එ ම හ ත නල නලින් වන දහන වන මෙ ත
දු . සි රි ත රජ කුමැතිගෙන් නසිය සැම තැ ත

සමවූ වැසි සුළඟින් ක්ෂේත්‍ර වසතුන් වඩන වන්නාක්මෙන් ධාර්ම්මික රජු ද ප්‍රාඥ මන්ත්‍රීහු ද කරණ කොට ලොක සත්වයා රක්ෂා වෙයි. චණ්ඩ මාරුතයා විසින් වැලඳ ගත් දවාග්නියෙන් වනය දවෙන්නාක් වෙන් දුක්ඛ පැවතුම් ඇති රජු සහ දුශ්ශීලවත් අමාත්‍යයා කරණ කොට සියලු රාජ්‍යයෙහි ලොක සත්වයා විනාශ වෙයි.

මහත නල නම් චණ්ඩ මාරුතයයි. අනල නම් වහ්නියයි.

30 නුවණැත් තවුන් පහ කොට දුදනන් සෙවූ ත
නොමගත් සිත තුලෙහි ගුණ පොකුරඹ ලෙසි ත
මැ ද හ ත් නොව මසුරු ගුණයෙන් දවසරි ත
ර ජු ට ත් ඇතොරටත් අතුරක් නැත වෙනි ත

නුවණැති අමාත්‍යයන් පහකොට දුර්ජන අමාත්‍යයන් සෙවනය කරන්නාවූ ද, නෙලුම් පතෙහි වත් දියත්තක් සෙයින් සිතෙහි සදගුණ රඤ්ජනය නොකළාවූ ද, සමානානුමතා සඞ්ඛ්‍යාත මධ්‍යස්ථ ගුණ සෙහි නොපිහිටා මැසර ගුණයෙන් හෙවත් පරසම්පත්‍ය සහනතායෙන් යුක්තව දවස් යවන්නාවූ ද රජුට හා ඔහුගේ අන්තඃපුරයටහෙවත් රාජ මහිලා ගෘහයටත් ඒ දුෂ්ප්‍රතිපත්තියම විනා අන්තරාය පිණිස පවත්නා අන්‍යවූ හෙතුවක් නැත්තේය.

31 පැ මි ණෙ ත ලොවට බ්‍රූනා ගුණ යුතු නපු රැ
මෙ දි ය ත නසිනු මිස යහපත නොවේ ස රැ
නොනැව ත සුගතැ පත් වූ සදෙහි සත්හි රැ
වි ක සි ත නොවී ද යෙයි සැමතැන තබ්‍රු රැ

"බ්‍රූනා" නම් මහිපති (රජ) යි.

නාමරස විකාශන කතීවූ සූර්‍යයාම අධික චණ්ඩ ගුණ ඇති වූ කල්හි එම තබ්‍රුරු නසයි. නපුරු ගුණ යුත් රජු විසින් ද එසේ ම ලොව නස්නේය.

32 රැ දු රු ගිනිකඳක් ගත් සදෙහි වනතු රැ
මි තු රු වේය දිගතින් හමන මඳම රැ
මි තු රු නැසීමට එක් වෙයි පසමිතු රැ
මි තු රු නෑකෙනෙක් නිවතුන්හට කවු රැ

මරු නම් මාරුත (සුළඟ) යි.

මිත්‍ර හෙදය පිණිස ප්‍රතිමිත්‍රයා (සතුරා) එක්වෙයි. නිර්ධනීන්ට මිතුරු නෑ කෙනෙක් නැත. ලාභාපෙක්ෂා ඇත්තවුන් ඉවත් වූ කල ඉතිරියක් නොලැබෙයි, එබැවිනි.

33 සැ ග ත් බණ ඇසූ සවිසතුනි නැණිව ත
අ න ත් කිරීමට නොප සිතෙහි ඇත නැ ත
ඇ තොත් මඳක් වත් පරවැඩටත් එසි ත
ක අ ත් සැපත් නොම වෙද මොක්පුර සැප ත

බුදුබණ ඇසූ සියලු නැණවත් සත්වයෙනි (අන්‍යයන්ට) අනර්ථ කිරීමට නොපමාවේ සිත්හි උත්සාහ ඇත්තේය. (අනුන්ගේ) අභිවෘද්ධිය පිණිසත් ඒ (උත්සාහ) සිත මඳක් වත් ඇත හොත් නිවන් පුර සැප කවරකු අතට සම්ප්‍රාප්ත නොවේද?

34 බ ලැ ත් ත වුන් හට බන් වෙරෙහි නො නැව ත
වි ප ත් පැමිණියත් ඉන් කිසි නිගා නැ ත
ම හ ත් විදුරු ගිරි බිතකට වැද අනු ත
සු න ත් දළ ඇතුට ලොවැ අපහසෙක් නැ ත

බලවන්තයන්ට වෛර කිරීමෙන් තමන්ට විපතක් පැමිණියත් (දුර්බලයන්ට) එයින් කිසි නිග්‍රහයෙක් නැත්තේය. ඒ එසේ මැයි:-මහත් වජ්‍ර (දියමන්ති) පර්වත භිත්තියකට වැද අත්න කල දළ බිඳුණත් ඇතාට ලෝකයෙහි නිග්‍රහයෙක් නැත්තේය.

35 න පු රැ කලට සතහට පැමිණෙන වෙහෙ ස
එ දු රැ නොවෙයි කළ පව් පල දෙවා මි ස
ත ඔ රැ වනය මුකුලිත වන බව සව ස
'ක වු රැ විසින් වැළකිය හැකි මෙ දිය කු ස

"පැමිණෙන" යනු අනියමාර්ථයෙනි වූ අසමභාවන ක්‍රියායි. එදුරු නොවෙයි යන තන්හි "එ" යන සර්වනාමයෙන් වෙහෙස යනු උකතයි.

නපුරු කල නම් පූර්භවයෙහි කළ පාප කර්මයාගේ විපාක දෙන කාලයයි. එබැවින් සවස් කාලයෙහි පියුම් විලට ස්වභාවයෙන් පැමිණෙන විපත්තිය මෙන් යමකුහට කාලසඤ්ඤාත විපත්තිය එළඹ සිටිය හොත් කළ පව් පලදුන් කලම දුරුවෙයි, එයින් පෙර දුර්නිවාරයි.

36 ක ර දර දුදන පිරිසිදැ දතුව ද සත ර
ගොර තර සපුන් විලසින් කටමිණි ලක ර
න ර වර සඳුන් තුර වලදිමිනි හැම ව ර
ප ර නට විසම මිස අම දෙනි කවර ව ර

ඉතා ක්‍රූරවූ දුර්ජනයා ශාස්ත්‍රය අවසන් කොට දත්තාහු නමුත් කණ්ඨ මාණික්‍ය සහිත වූ අහිගයෙන් රෞද්‍රවූ නාගයා මෙන් නිතර නරෙන්ද්‍ර නමැති සඳුන් රුක ආලිඞ්ගනය කොට ගෙන අන්‍ය යන්ට භයම එලවයි.

37 උ ද ක් සමින් පිඹ්ලූ පමණින් බැර්
ප ස ක් ලොහො ම ද අළු වෙයි වෙන වෙන ම
දුක ක් පැමිණි ගුණවත් දන ලූ සුසු ම
වග ක් නසනු විසිතුරු කොට කියනු යි ම

රන් රිදී තඹ යකඩ ඊයම් යන මේ පස් ලොහොය, මින් එකක් එකක් වෛද්‍යාදිහු සමින් ම පිඹ හසම කෙරෙති. මළ සමකින් පිඹීම් පමණින් ලොහො පසක් ද හළුව සන කල සදගුණවත් උත්තමයාහට දුකක් පැමිණ සුසුම් ලූ හොත් පෙළිපතක් විනාශවීම ආශ්චර්ය නොවේයි. ගුණවතුන්ට අපරාධ හො කටයුතුයි. පුත්‍ර පෞත්‍රයන් කරාද විනාශය පැමිණෙයි.

38 තු ල සිය දිවි පුරුදුව විසුවත් නොම දි
දු ල ගුණ සුදනන්ගෙ නොදනිති දනෝ ද දැ
වි ල වැනි මැඩිහු නොදනිති පියුමෙහි සුව දැ
ව ල බිහු එ මුවරද ගෙනැ මත්වැ දෙති න දැ

සවකීය ජීවිතය මෙන් පුරුදුව විසුවත් අඥජනයෝ සත්පුරුෂ යන්ගේ ගුණ මහත්වය දැන නොදනිති. එකවාසක මණ්ඩූකයෝ පඹකජ සුගන්ධය නොහඳුනති. වනවාසක භෘඞ්ගයෝ දුරින් අවුත් මොන් ගෙන සතුටුව නාද පවත්වති.

39 කු රි රු ගොර සපුන්ගේ දළිගෙහි වි ස ය
ම දු රු මැසි කැලන්ගේ තුඩගෙහි වි ස ය
රු දු රු නුහුසුවන් නැමි වලගෙහි වි ස ය
නපු රු දුදනන්ගෙ සියොලහෙහි ම වි ස ය

"නුහුසු" නම් වෘශ්චික කීටයා (ගෝනුස්සා) යි. හිස් ශබ්ද යාගේ ශීඝ්‍රාර්ථය "න" යන නිපාතයා විසින් ප්‍රතිෂිඩය. "න, හිස්" යනු පූර්වාපර පදයන් කරණකොට තදභවාර්ථයෙහි නාදි අව්‍යය සමාසවූසේයි. හිස්නැත්තේ යන අර්ථයි.

ඝෝර සර්පාදීහු එක්එක් අවයවයෙක්හිම විෂ ඇත්තාහු වෙති. දුර්ජනයා වනාහි සකල ශරීරයෙහි විෂ ඇත්තේය. අත්‍යර්ථ යෙන් ම නොසෙවිය යුතුය යනු භාවයි.

40 ප ර සි දු පබු දනන් සෙව් පමණින් මහ රූ
බෙලෙ නි දු මඳ වුවත් නො කෙරෙති රූපුන් ස රූ
බ ර ණි දු ගෙලෙ වසන නාරද වෙමින් ග රූ
ගු රු ළි දු අනින් ඇසි කිම යහළු නොරතු රූ

නාගයා ගුරුළුහට ගොදුරුයි, ඊශ්වරයාහට ග්‍රීවාභරණ රූප යෙන් නාගයෙක් වෙසෙයි, ඒ තෙමේ තමා ආශ්‍රය කළ ඒ මහදෙවියා

න් ආනුභාව මහතත්වය සලකා ගුරුළුගෙන් ඇතිවන සහජ භය නොසලකා මිත්‍රසම්භාෂණයක් සෙයින් "යහළු නොරතුරු කිමැ" යි ගුරුළුගෙන් ඇසීය. අහෝ ගළියෙක පමණ බැලුව මැනව! ස්වාමියාගේ බලපරාක්‍රමය සලකා තමාගේ ප්‍රමාණය ඉස්මවා අනුන් හෙළා දැක්ම යුක්ති නොවෙයි.

41 ස ත නි න් පවන් අඹ කොල බුදින තවස ර
දැ හැ නි න් මිදෙත් දුට ලෙල දෙන ලිය නඹ ර
බු දි මි න් යමෙක් කිරි නෙල් දි රස අහ ර
ඉ ඳු ර න් දමන සිදු ඉපිලෙයි මදර ගි ර

වායුවද ජලයද පත්‍රයන්ද අසහායාහාරකොට ඇති තාපස යෝ ගැහැණු රුවඇති නාරිලතා පුෂ්පයන් දුටුකල පවා ධ්‍යාන යෙන් පිරිහෙති. (භක්ත භෝජනාදියෙන් දුරුවූ බැව් "සතනින්" යනුවෙන් කියත්) කිරි ගිතෙල් දී ආදී (රස ඔජා වර්ධනයටහෙතු) ආහාර අනුභව කෙරෙමින් යමකු විසින් පඤ්චේන්ද්‍රිය දමනය කරන හොත් (සමුද්‍රමන්ථනදණ්ඩ රූපයෙන් කල්පිතවූ) මන්දර පර්වතය සමුද්‍රයෙහි ඉල්ප සිටියි. සැප විඳිනුවන්ගේ චක්ෂුරාදි ඉන්ද්‍රිය නිග්‍රහය අදභූතයයි අභූත නිදර්ශනයෙන් කිහ. 1

42 කු ස ඔ ත සිය සොහොවුරු වුව ද තමහ ට
ඝිතනැ ත යෙහෙ දුරු කළි පොකුරඹ ලෙස ට
ත ම ග ත වා පිත් සෙම් කිපෙනුය මර ට
ඛ න් ග ත ඔසු වග ඝිත වෙයි සුව පත ට

එක් කුස උපන් සහොදරයා වූයේ නමුත් තමාහට අහිත (අනතුරය කර) වීනම් නෙලුම් පත වැකි දියත්තක් මෙන් වැද්ද

---

1 "පවන් කොල අව, සුලඟින් පත්‍රයන් ආයේ නම්" කියා ඇතම් කෙනෙක් අදහස් නොදැන අශුඛ කළහ.

වානාම්බු පර්ණාහාර කොට තපස් කළ ඒ විශ්වාමිත්‍ර පරාශරාදි (ඍෂි) හු පවා අත්‍යර්ථයෙන් ලීලොපෙත නාරී මුඛ පද්මයන් දුටු කෙණෙහි (කාමයෙන්) මුළාවට ගියහ. යම් මිනිස්හු ගිරෙන්හා දියෙන් යුක්තවූ ගිතෙල් සහිත හැල් බත බුදිත් ද ඔවුන්ගේ ඉඳුරන් දමනය ඉදින් ඇතිවෙයිනම් (එකල) විඳ්‍ය පර්වතය සයුරු තරණය කෙරෙයි. ඉලාපෙයි. කියේ මැනො? භර්තෘහරිහු විසින්:-

"විශ්වාමිත්‍ර පරාශර ප්‍රභෘතයො, වානාම්බු පර්ණාශනා-
ස්තෙපි යත්‍රි මුඛපඞ්කජං සුලලිතං, දෘෂ්ටෙවව මොහංගතාඃ
ශාල්‍යන්නානං සඝෘතං පයො දධියුතං, භුඤ්ජතෙ යෙ මානදිඃ-
සෙෂාණාම්න්ද්‍රිය නිග්‍රහො යදි භවෙච්ඡ්‍යතරෙත් සාගරම්" යි.

නෙදි දුරු කටයුත්තේය. ඒ එසේමැයි:-තමාගේ ශරීරය පිළිබඳ වම පවත්නාවූ දෝෂයන් කුපිත වූ කල මරණය ගෙන දෙයි. එයින් සුවය ලබනු පිණිස ඖතයෝ නම් වනගත ඖෂධ වගීයෝ මැයි, සඛයයෝ නොවෙති.

43 ප ර සතු දෙයක් උදුරන ලෙසට කරු ලො ල
වෙ ර දුදනන් පැවසූ නෙක බොරු ඇතපු ල
නි ර සර මහතුන්ගෙ සිතැ නොරඳයි නිම ල
සු ර තුර විමන වෙද රිටුනට කුවර ක ල

පර සන්තක වසතු පැහැර ගනුවයි වෛරී දුර්ජනයන් කී බස් මහොත්තමයන්ගේ නොකිලිටි සිත්හි නොපිහිටයි, ඒ එසේ මැයි:-අරිෂ්ටයා (කව්ඩා) හට දිව්‍ය වෘක්ෂය කිසි කලෙකත් වාස ස්ථාන නොවෙයි.

දුර්ජනයාගේ වචනය අරිෂ්ට පක්ෂියාහට ද මහතුන්ගේ සිත සුරතුරට ද සමාන කළහ.

44 ස ත් ගුණ යුත් සතන්හට වැඩ කලොත් ස රු
අ ත් පිට දියුණුවම එම කෙරෙති නිරතු රු
ව ත් කළ දිය හෙරළුතුරු මුලට පියක රු
දෙත් මුදුනෙන් දරමින් රැගෙන අම්බු රු

සත්‍ය ගුණයෙන් යුක්තවූ සජ්ජනයන්ට යම් අභිවෘද්ධියක් කළ හොත් විදුණ කොටම එබඳුම අභිවෘද්ධිය ප්‍රත්‍යක්ෂ ලෙසින් එකාන්තයෙන් (ඒ සත්පුරුෂයෝ) කෙරෙති. නාලිකෙර වෘක්ෂයන්ගේ මූල භාගයට ජලය වත්කළ හොත් අමෘත ජලයක් මෙන් (මධුර රස හා සෞම්‍යගුණ ඇතිකොට ඒ වෘක්ෂයෝ තමන්ගේ) මස්තකයෙන් (ඒ ජලය) උසුලමින් ගෙන දෙත්.

45 නැණැති දනන්හට මඳ ගුණයක් කළ ද
ප ව නි ගලැකෙටු අකුරක් මෙන් නිබ ඳ
වි ම නි දනන්හට කළ කිසි ගුණ නොම ඳ
එ නැ නි වේයැ දිය පිට ඇඳි ඉරක් ලෙ ද

වෙමතිකයා නම් යථාර්ථය නොසලකන්නාවූ විරුඬ මති යුක්තයායි. අඥානයායි.

46 අ මි ත ගුණ නුවණ යුතු උතුමෝ පබ ඳ
අන ත වෙහෙස ලදුවත් නොම වෙති දුහ ඳ
දි ග ත පතළි සුවඳැති සොඳ සඳුන් ක ඳ
සි දි ත මඬිත එක ලෙස පැතිරෙයි සුව ඳ

අප්‍රමාණ ගුණ නුවණින් යුත් ප්‍රසිඬ උත්තමයෝ අනන්ත පීඩා ලැබූ නමුත් නපුරු අදහස් ඇත්තෝ නොවෙති. දිගන්තයෙහි පතළිවූ යහපත් සුගන්ධ ඇත්තාවූ චන්දන යකඩය කපන කල්හිද තළන කල්හිද එකාකාරව සුවඳ විහිදෙයි.

47 බු දු න් දහම් සඟනට නොකෙළෙමි අද ර
නිව න් දකින පිනකුත් නොකෙළෙමි පව ර
ලි ය න් තන නොසිපියෙමි සිහිනෙන් විත ර
උ ප න් නෙ මියොවුන් වනයට පොරොව යු ර

නිවන් පිණිස පිළිපැදීම මනුෂ්‍යානම භාවයාගේ පරම ලාභයයි, කාම ගුණානුභවය ද එකිතරා ලාභයෙක, මේ දෙවැදෑරුම් අර්ථය නොලබන්නහුගේ ඉපදීම නිරර්ථකයි. ඔහුගේ උත්පත්තිය හෙතු කොටගෙන මාතාවගේ යෞවන භාවය නැසී ගියේය. හුදෙක් වවගේ යෞවන වනවෙශ්දයට කුඨාරොපම වූයේමවෙයි.

මවගේ යෞවන භාවය උපමෙයයි, වනය ඊට උපමානයි. මොක්ෂය කාමය යන උභය සම්පත්ති ප්‍රතිලාභයම පිණිස නො පවත්නහුගේ ජන්මය ඒ යොවුන් වනය සිදීමට පොරොවක් වැනි වෙයි.1

48 නො ම ද න් සතෙක් ගැඹරින් යුත් පද සත ර
ප ද රුත් වියකමැයි සලකනු සබය තු ර
ම ද ම ත් තුනු මහත් වන ගිජිදකු ළත ර
සි ය ප ත් නල හුයින් බඳිනෙව් කරන වැ ර

ගම්භීරාර්ථයෙන් යුක්තවූ චතුර්ධ පදය ඉගෙණ නොගත් යම් තැනැත්තෙක් සභාභ්‍යන්තරයෙහි යම් පදාර්ථව්‍යාඛ්‍යානයක් (අරුත් බිණීමක්) කරමැයි කල්පනා කිරීම කෙයේදැයි යත හොත් මදයෙන් මත්වූ උස් මහත්වූ දැඩිසිත් ඇති වන හස්තිරාජ යක්හු මෘණාලයෙන් (නෙලුම් දණ්ඩෙහි තුලින්) බඳින්ට කරන උත්සාහයක් මෙනි.

නාමාඛ්‍යාතොපසර්ග නිපාතයයි යන චතුර්විධ පදයාගේ විස්තර විභාගයම ව්‍යාකරණ ශාස්ත්‍රය වෙයි. එබැවින් ඒ ශාස්ත්‍රය මනාකොට නොහදාළ තැනැත්තහුගේ පදාර්ථව්‍යාඛ්‍යානයෙක් නම් නැත්තේය. එබැව් මේ උපමායෙන් සපුට කරන ලදි.

---

1 මෙහිදී ග්‍රන්ථ කර්තෘ තෙමේ "නොකෙළෙමි" යනාදී වශයෙන් මේ අවර්ණ්‍ය ජීවිතය තමන් හට ඇති සේ දක්වා උත්තම පුරුෂ ය ම යෙදීය, මෙසේ යොදන ලද මශබ්ද කාරකය ග්‍රන්ථාන්තරයෙහිද දක්නා ලැබේ. මේ තුරුස්නා ඇතැම් කෙනෙක් "නොකෙළෙද" කියා විපර්යාස කොට "උපන්නෙ මයොවුන් වනයට පොරව යුර" කියාද පදය දූෂිත කළෝය. පණ්ඩිත මානී අවිඥයන්ට මෙබඳු සාහසික ක්‍රියා නොකට හැකි නොවෙයි.

49 කෙ තෙක් ගුණ කළත් දුදනන්හට අසු ඛ
අ ක ක් පමණ වත් නොකෙරෙති පිරිය ලො ඛ
ළු උ ක් රසෙහි සැදුවත් නිඹබිජු කිර ඔ
ඊ ද ක් තිත්තමය ගැඹපස තුරෙහි නි ඔ

අරිඹවූ දුජ්නයන්ට කොපමණ යහපත කළත් සවලා ප්‍රමාණයක් වත් ප්‍රිය ලොභයක් නොකෙරෙති, ඒ එසේමැයි:- උක් සතුරෙහි කොසඹ බීජයක් ක්ෂීර ජලයෙන් වැඩුවත් ඒ නිම්බ වෘක්ෂයාගේ ඇතුළු පාශ්වය තනි තික්ත රසම ඇතිවෙයි.

50 ස ඳුන් කපුරු සමගින් පිනිදිය නොම, ඳ
සොඳින් කලල් කෙරෙමින් සුවඳ මුව ම ඳ
නි නින් ගිමඹ ඉසැ ඉසැ ලුහුනු වැවුව ඳ
ත ම න් ගුණය නොහරින වැනි දුදන හ ඳ

බොහෝවූ පිනිදිය සමග චන්දන කර්පූරයන්ද සුගන්ධවත් වූ මෘග මදය (කස්තුරි) ද මනාසේ කලල්කොට (ඉතා සිසිල්වූ) තුෂාර ජලය නිතර ඉසිමින් ලුහුනු වැඹුයේ වි නමුත් (ඒ ලුහුනු අලය) තමාගේ සවභාව ගුණය අත්නොහරියි එසේම දුජ්නයා (කෙතෙක් සත්කාර කළ නුමුත්) දුර්ගුණ නොහරියි.

51 ස ම ගින දුදන සත සහ වනු බඳිනු වෙ ර
නොයෙදෙ න කරණු මය සුදනන්හට පව ර
ගි නි ගෙ න දිලි අඟුරු ගත් කලැ දවයි ක ර
නි වි තැ න රැගත් හොත් කළු වේය නො විත ර

දුජ්නයා හා සමග මිත්‍ර වීම ද වෛර බැඳීම ද සත්පුරුෂයන්ට යුතු නොවෙයි. උද්දීපනවූ තපනාඞ්ගාරය ගත් කල්හි අත දවයි. ශාන්තවූ අඟුරු ඇල්වූ කල්හි බොහෝ සෙයින් අත කිලිටි වෙයි.

52 ප ත ර දුදන අනදර සුදන අදර ඳ
අ ව ර දිනිඳු සේ ලෙස වැඩි වෙයි නිබ ඳ
අ ද ර අනදරද පිළිවෙළිනොවුන් හ ඳ
ළ ඟි ර සේ වැන්න අඩුවන මඳින් ම ඳ

දරුණුවූ දුජ්නයාගේ අනාදරයද සුජනයාගේ ආදරයද අපර භාගයෙහි සූර්යයා කරණ කොට ඇතිවූ ඡායාව මෙන් ක්‍රමයෙන් වර්ධන වේයි. පරිපාටියෙන් ඒ දුජ්න සුජනයන්ගේ හෘදයෙහි ඇතිවූ ආදරය හා අනාදරයද මඳින් මඳ අඩුවන්නාවූ තරුණ සූර්යයාගේ ඡායාව වැන්න.

60 ලො වි න් එකෙක් එකදේකට වෙයි සම ත
වෙ නි න් අනික් දේකට අනිකෙක් සම ත
නො මි න් සුලභ ලදුවත් තද ගිම් සැප ත
ගො ඩි න් නැව දියෙන් රතයද නොයනු යු ත

එක්තරා කර්ම්මාන්තයෙක්හි යමකුගට චාතුර්‍යය ඇතිකල අනික් අනික් කර්ම්මාන්ත විශෙෂයෙහිද සමර්ථයයි මෙසේ නො සිතිය යුතුය. මේඝභාවධර්ම්ය නෞකාවට න්‍යායයෙන් දත යුතු.
(තද සුලං ලැබුවත් නෞකාව ගොඩ ගමන් නොකෙරෙයි. ශීඝ්‍ර කාලය පැමිණියත් ගැල (රථය) දියෙහි ගමන් නොකරයි.)

61 මු දු ව ට සිනිඳු වෙඬරුද සුදනන් හද ද
සරි කො ට කිවත් කිවිදන නොම වෙයි එලෙ ද
පර ත ට තැවුල් වත උණු වෙයි සුදන හ ද
එ ලෙ ඇ ට උණු නොවෙයි එබැවින් වෙඬරු ත ද

වෙඬරුත් සත්පුරුෂයාගේ හෘදයත් මෘදු ගුණයෙන් සමාන කොට කවිජනයා විසින් කියන ලද නමුත් මේ වස්තු මය විසදෘශය, සම නොවෙයි. කුමක් හෙයින්ද යත්:—සත්පුරුෂයා ගේ හෘදය අන්‍යයන්ට පැමිණෙන තාපයෙන් පවා උණු වෙයි. වෙඬරු වනාහි තමන්ට ඉන්නක් පැමිණි කල්හිම උණු වෙයි. එබැවින් සත්පුරුෂයාගේ හෘදයට වඩා වෙඬරු දැඩි ගුණ ඇත්තේ වෙයි.

62 නො හි ම් සුවඳ විහිදෙන කස්තුරි නිම ල
උ තු ම් මුව නැබෙහි තැබි බඹ නැණ විය ල
වි ත ම් මෙමට මහබඹ පදවි යම් ක ල
ත බ ම් බොරු කියන දුදනන්ගෙ දිව මු ල

අප්‍රමාණව සුවඳ විහිදෙන නිම්ලවූ මෘග මදය ලොක නිර්ම්මාණය කරන මහාබ්‍රහ්ම තෙමේ (තමාගේ) ශුභවෛකල්‍ය යෙන් (උත්තමත්වභාවය හෙතු කොට ගෙන) උතුම් වූ (අවි හිංසක බ්‍ර) මුවාගේ නාභියෙහි තැබිය. (ලොකය මවන) මහා බ්‍රහ්ම පදවිය යම් කලෙක මාහට පැමිණියේ නම් (එකල්හි) අසත්‍ය වචන කියන්නාවූ දුර්ජනයාගේ දිවමුල කස්තුරිකාව මවන්නෙමි.

එසේ ඇති කල්හි සුරභි ගන්ධයෙන් යුක්තවූ ඒ උත්තම වස්තුවට ලොභ කරන් මනුෂ්‍යයෝ යමෙක් බොරු කී කල්හි ඔහුගෙන් කස්තුරි පැහැර ගන්නා පිණිස දිව කපති. අනෘත වාදිහුගේ දිව කැපීම කාව්‍ය කතෘහට රුචියයි කීසේක්.

63 අ බ ර ණ සමන සිටි පිරිවරද නම වෙ ත
නොදෙර ණ නැනැ යෙදුවහොත් නොම වේ දිමු ත
කො පම ණ රජ ඉසුරු ලදුවත් මුළු දිය ත
සි ළු මි ණ සරණ බඳහොත් අපහස කර ත

(ග්‍රීවාභරණ පාදභරණාදි) ආභරණ විශෙෂයන් හා නමා කෙරෙහි පවත්නා පරිවාර ජනයන් ද අයථා භූමියෙහි (අයොග්‍යවූ ස්ථානාන්තරයෙහි) යෙදුව හොත් නො බබලයි, සකල ලොකයෙහි (චක්‍රවර්ති) රාජ ඓශ්වර්‍ය ලද්දේ වී නමුත් චූඩා මාණික්‍යය (ඔටුන්නෙහි මුදුන් බැණික පාදභරණ කොට) චරණයෙහි බැන්ද හොත් (ලොකවාසීහු ඔහුට) අපහස කෙරෙත්.

64 නො වි ත ර තෙද බලැති මහතුන්හට පව ර
වැ ර සැ ර මද නුවණ මද දන බඳිනු වෙ ර
තු හු ත ර ගිරි පුළුන දළු දළුඟින් පැහැ ර
ම ත ව ර ණිදුට පෙදෙනැන වෙහෙසෙන අයු ර

බොහෝ වූ තෙජොබල ඇති උත්තම වූ මහාත්මයන්ට වීරසාර ගුණයෙන් හා ඥාන ශක්තියෙන් මන්දවූ ජනයාගේ වෛර බැඳීම කෙසේද යත්:—ශක්තිමත් දළින් ඇත මහගල් උපුටන්නා වූ උස් මහත් වූ මත්තගජරාජයාට පයින් ඇන වීඩාවට පැමිණීමක් වැන්න.

65 නි ර ස ර ගුණෙන් යුතු මහතකුහට පව ර
ස මු ද ර සියල් කිඳලෙක තුඹසෙක සුනෙ ර
පු ව ත ර මෙදඹදිව මළුවෙක සියගෙද ර
ඔහු ක ර නොවන සැපතෙක් එබැවින් කව ර

ස්ථිර සාර ගුණයෙන් යුක්ත වූ උත්තම වූ මහාත්මයන්ට සකලසමුද්‍රය කුඩා විලක් මෙන් සුළුය, සුමෙරුපර්වතය තුඹසක් සේ කුඩාය, විශාල වූ මේ දඹදිව සවකීය ගෘහවාරයෙහි මිදුල මෙන් අතිශයින් විෂය වන්නේය, එසේ කල ඒ උත්තමයාහට සන්තප්‍රාප්ත නොවන සම්පත්තියක් නම් කවරේද?

66 නො ප ණ ත් අය අනත අහසෙව් නැත නිය ම
එ ම හ ත් බැවින් වනසනු නොයදෙත් සැවොම
ත ම සි ත් තුළෙහි වෙර නැසුවොත් නො තබාම
වැ නසෙ ත් ඔවුන් හැම දියවන් ගිනි සේ ම

අශික්ෂිත වූ අධාර්මිකයෝ සඛ්‍යාවිෂයාතික්‍රාන්තයහ. මෛත්‍රී වඩන්නහුට ඒ ක්‍රූර ජනයන්ගෙන් ගැහැට නොපැමිණෙයි. චණ්ඩගුණවත් වහ්නිය සෞම්‍යගුණවත් ජලය කරා පැමිණි කලතෙමේ විනාශ වෙයි.

67 ව න ක ල සතුන්හට සිරිසැපත මනක ල
ක ස ප ල තුළෙහි දිය ලොඳ මෙන් වෙයි විපු ල
ය න ක ල එ සිරි සම්පත් වැනසෙයි සිය ල
ශ ජ ශ ල ඇතුළැ ඔදසුන් දිවුලපල තු ල

කස ශබ්දයෙන් නාරිකෙල වෘක්ෂය (පොල් ගස) කියනු ලැබේ. මෙහි කසපල යනුවෙන් තත් තරුණ ඵලය නිර්දිෂ්ටයි. (මේ අර්ථයෙන් කුරුම්බාවතුරට කසපැන්යයි කියත්.)

හස්තීන් විසින් ගල්නෑ ලද ගිවුලු ඵලය ඔජාවෙන් ශූන්‍යව බනිශීන වෙයි. 'සත්‍රියාගේ විභව සම්පත් විපත් දෙදෙනා කර්මානුරූපවම වෙත්. මේ ඵලවය ඒ සඳහා නිදර්ශනයි.

68 ම හ ත් දනවතුන් ඇතිවද සුදන ගෙ න
ශ නි ත් තමන් කටයුතු නිරිදෝ නිති න
ඇත ත් කෙළිගණන් රැස්කළ දන නොම් න
බ ල ත් ලොහොදපණතල ගෙන තම වුව න

(සත්පුරුෂ ගුණයෙන් ප්‍රකාශ නුවූ) මහා ධනවත් ජනයන් ඇතත් නරෙන්ද්‍රයෝ (දිළිඳු වූද) සත්පුරුෂයන්ගෙන් ම තමන් කටයුතු කර ගනිත්. සුවර්ණ රජත මණි මුක්තාදී අප්‍රමාණ ධනය ඇති නමුත් ලෝකයින් කළ දර්ශනතලයෙන්ම තමන්ගේ මුහුණ බලත්.

69 ම ද යෙ න් මත් මතඟ කුඹුතල පිරිමදි නි
වි ස යෙ න් දැඩි උරඟ උරතෙලෙනි පලදි නි
මෙලෙසි න් අසිරිමත් විසිතුරු සත කෙරෙ නි
එ ම දි න් රජුන්ටත් සේවය කරු රැකෙ නි

මනුෂ්‍යයෝ අසමර්ථතාව ආශ්චර්‍ය අද්භූත ක්‍රියා කෙරෙති. මදුතුන්ගේ කුම්භස්ථල (හස්තිශිරස්ථ මාංස පිණ්ඩ) යන් සව හස්තයෙන් සපශී කෙරෙත්, උග්‍ර විෂ ඇත්තාවූ නාගයන් වක්ෂස්ථලයෙහි ආභරණ කෙරෙත්, ඒත් මද වැ රජුන්ට සෙවා ද කෙරෙති. රාජ සෙවා නම් අතිශය භය ඵලවන්නිය, එබැවින් ඕ මය අති විචිත්‍ර නම්.

70 වි හි දු තුරු සෙනඟ පිරිවර යුතු නොම් න
සි නි දු අමා කිරණින් ලොව බබුළුව න
ත රි දු දිනිඳු ගමුවත නො දිලෙන සෙයි න
කෙබඳු කෙනෙක් ලුහු නොම වෙති අන් දව න

තමන් නොදන්නා අන්‍ය භාෂාවකින් කථා පවත්නා සභා වෙහිදී උත්තමයා පවා ලාඝවයට (අගරු බවට) පැමිණේ.

71 ක ලු න් මැද්ද සබ අඹතුරු බොහොසෙ නි ති
ලෙ සි න් විදුලි දිලි කගපත් ලෙල කෙරෙ ති
ක ගි න් කග පහර වැද නැඟි පුලිඟු ඇ ති
ස ට න් බිමැ කගත් සෙබලෝ දුලබ වෙ ති

ස්ත්‍රීන් අතුරෙහි ද සභාවෙහි ද කඩු දරන්නෝ බොහෝය. කඩුවෙන් කඩුවට පහර වැදීමෙන් උපන් ගිනි පුපුරු ඇති යුඬ භූමියෙහි කඩු ගත් සෙවා භටයෝ එපමණ නොවෙති. ස්ත්‍රීන් අතුරෙහි භටගන්නා අඬදබරද සභාවල ඇති වන වාද වෛරුඬ්‍ය යද අතිශයොක්තියෙන් කීහ. 1

72 මෙ ලො වි න් පරලොවින් වන අවැඩ නොම ද න
සි රි ති න් ලොවැ පැවති නැණ්මඳ බල දුද න
දෙ කුලෙ න් යුතුවැ උපනත් සක කිරි ලෙසි න
කු සු මෙ න් උපන් පණු වැනි පෙර කළ පව් න

දෙලොවින්ම වන්නාවූ අනභිවෘඬ්‍යය 'හෙඬත් විනාශය නො දැන ලෝකාභ්‍යාසානුගතව පවත්නාවූ අඥාන බාල දුර්ජනයා ශඬ්ඛ ක්ෂීරය මෙන් උභය කුල පරිශුඬව උපන්නත් වණී ගන්ධ ගුණො පෙත පුෂ්පයෙන් උපන් කෘමියෙක් මෙන් පූර්වයෙහි කරන ලද පාප කර්මයෙන් හීන භාවයට පැමිණේ.

73 නෙ ක ව ත් ඇතත් මෙතෙකැයි යන පමණ නැ ති
ලො බ සි ත් වෙමින් ඉල්වනු දිළිඳුන් සිරි ති
ද ළි නෙ ත් නියුතු මෙහෙසුරු පුවතර තෙද ති
ජ ර ප ත් මහලු ගොන් වාහනයෙන් සර ති

දිළින්දට බොහෝ වසනු ලැබුණත් සිරිත් වසයෙන් අනුන් ගෙන් ඉල්වයි. ලලාට නෙත්‍රයෙන් යුක්ත වූ මහත් තෙජස් ඇත්තාවූ මහෙශ්වරයා නන්දී නම් මහළු ගොනකු පිටින් ගමන් කෙරෙයි. පෙරා සිට පැවති පුරුද්ද අත් නොහරියි. එහෙත් ඒ තෙමේ අතිශයින් ඊශ්වරයි. 2

---

1 කගත් කියා තුබූ පාඨය සන්නකාරයෝ "ඝිගත්" කියා පෙරළූහ. මක් නිසාද? ගත් කියා පදයක් වෙන්කළ කල්හි ඔවුන්ධ රුචිවූ (කඬු, කග) ශබ්දයක් ඉතිරි නොවී කයන්නක් පමණක් ශෙෂ වන බැවිනි. මෙහි කග+අත්=කගත්, කියා සිඬයි. කඬු ගත් අත් ඇති යන අර්ථයි.

2 "දරිද්‍රස්‍ය පරාභූතිනිඃ" යනාදි ශ්ලෝකයට මේ සමයයි නිදර්ශනිය යුතුයි.

74 ස සො බ න මහතුන්ට වත් නොමඳ ගරුත ර
දි න දි න පුරුදු වීමෙන් කෙරෙති අනද ර
නො ම දි න සුවඳ විහිදෙන සොඳ සඳුන් හ ර
හි ම ව න වසන වැදි අහනෝ කෙරෙති ද ර

ඉතා ගරු කටයුතු උත්තමයන්ට පවා නිතර ආශ්‍රය ඇති වීමෙන් අනාදර කෙරෙත්. ඒ එසේමැයි:- බොහෝ සෙයින් සුවඳ පැතිරෙන චන්දනසාරය හිමාලය වනයෙහි හැසිරෙන කිරාතාඛ්‍ය නාවෝ (තමන්ට සුලභ බැවින්) දර පිණිස යොදති. (නිතර එකතැන විසූවත් උත්තමයා හෙළා දැක්ම යුතු නොවෙයි යනු ත්‍යාත්‍යයස්‍යාර්ථයි.)

75 ව නි න් ඛනින් බුලනින් සියලු සැපති නි
නි නි න් විඳින පහසින් රසමුසු බසි නි
ක තු න් සිත් ගනිමි සලෙලුන් යනු කෙවැ නි
දැ ලි න් සුලං බඳනට තැත් කරන මෙ නි

ධන ධාන්‍යාදි වසතු දීමෙන් ද බත් බුලත් දීමෙන් ද සකල සම්පත්ති ප්‍රදානයෙන් ද සතතයෙන් ඔවුනොවුන් අනුභව කරන සපශී සුඛයෙන්ද රස මිශ්‍ර වචන කථා කිරීමෙන් ද ස්ත්‍රීන්ගේ ප්‍රෙමය තමන් කෙරෙහිම පවත්වා ගනිමැයි සිතා සල්ලාලයන් උත්සාහ කිරීම කෙසේදැයි යතහොත්:-දැලකින් සුළං බැඳ නවත්වන්ට යතන කරන්නාක් මෙනි. ස්ත්‍රීන්ගේ ඇල්ම එකම පුරුෂයකු කෙරෙහි ස්ථිරව නොපවත්නේය යනු අන්තර්ගතාර්ථයි.

76 අ ම ර ස ව න් අඹරස බුදිමින් සිනි දු
නිනි ගෙවු ය න් පෙදෙසෙහි සරමින් පසි දු
එකපැහැයෙ න් ඉඳිනත් කොවුලන්ට බ දු
නද ප ම ණි න් දැනගත හැකි රිටුන් ඉ දු

ගෙවුයන් නම් ගෘහසමීප උද්‍යානයි, ගෙවත්තයි.

ආම්‍ර ඵල රසය අනුභව කිරීමෙන් ද ගෘහොද්‍යානයන්හි හැසිරීමෙන් ද කාල වර්ණයෙන්ද කොකිල පක්ෂීන්ට සමානව පැනෙතත් නාදයෙන් ම එකාන්තයෙන් අරිෂ්ට (කාක) පක්ෂීන් හැඳින ගත හැක්කේය.

උත්තමාධම මනුෂ්‍යයන්ගේ විශෙෂය ඔවුන්ගේ සුචරිත දුශ්චරිතයන් කරණ කොට ගෙන පරිඥනය කට හැක්කේයයි මේ අන්‍යාලාපයෙන් කීහ. (අනු අට වැන්නද මීට සමානාර්ථයි.)

77 වි සු ව ත් දුදන සහ සුදනන් රැගෙන ස රු
නැණවත් රජතුමෝ දෙති ඔවුනට ඉසු රු
වි ස යු ත් ගොර උරග කට රැඳි මිණි මිහ රු
ස ල ස ත් රුවන් කිරුළිග රුවනට සොඳු රු

දුජ්ජනයන් හා සමග (අවිශෙෂයෙන්) වාසය කළත් සත්පුරුෂයන් (තෝරා) ගෙන නැණවත් රජ වරු ඒ සත්පුරුෂයන්ට ඓශ්වර්‍යය දෙති. ඒ එසේ මැයි:- නාගයාගේ කණ්ඨයෙහි තුබූ උත්තම මාණික්‍යය රත්නකිරීටයෙහි චූඩාමණික්‍ය බවට පමුණුවත්.

78 ප ස න් සුදන දිමට වනබව අල ස
ල බ න් නවුන් පෙරකලැ කළ පවෙහි දෙ ස
ත ම න් මුව විසුළු වූ බව පෙනෙනු මි ස
වෙ නි න් කවර වරදද නිසි දපණ ප ස

දන්දිමෙහි ප්‍රසන්න සිත් ඇති සත්පුරුෂයා යම් විටක දිමට මැලි වේ නම් ඒ ලැබිය යුතු තැනැත්තන් විසින් පූර්ව ජන්ම යෙහි කරන ලද පාප කර්‍මයාගේ දෝෂයයි. වරදක් නැති කැට පතින් බැලූ විට තමාගේ මුහුණ විසුළුවී පෙනේ නම් එසේ වීමට හෙතුව මුහුණේම දෝෂයයි.

79 කි ය ත් මිසුරු රසබස් සැළළිගිණි කැ ළ
කෙ රෙ ත් යුද උනුන් එළ ගවර රළ ර ළ
දෙ තො ත් යමෙකු යඳි කලිමන් දුරහැර ළ
වි ය ත් කමුත් මිකුමුත් ඔහුමය නැබ ළ

ශාරිකා පක්ෂිසමූහයෝ මධුර වූ රස වත් වූ නාද පවත්වති. (මනුෂ්‍යයන් විසින් මධුර ගායනා පැවැත්වීම ආශ්චර්‍ය නොවෙයි, ව්‍යක්ත කමක්ද නොවෙයි.) එළු ගවර ආදි තිරශ්චීනයෝ සමූහ සමූහව ශ්‍රුඩකෙරෙති. (මනුෂ්‍යයන් විෂයෙහි ඔවුනොවුන් ඛබර කොට ගැන්ම සාමර්‍ථ්‍යයෙක් වික්‍රමයෙක් නොවෙයි.) යාචකයාගේ හෘදයෙහි ලොභ චිත්තය පහකොට හෙවත් ප්‍රසන්නතාර්‍ථ්‍ය සිඬ කොට යමෙක් වස්තුපරිත්‍යාගය කෙරෙයි නම් ව්‍යක්ත කම් හා වික්‍රම කම් ද ඒ දෙන උතුම් දැනයෝම වෙති.

80 ස පෙ ක් එකකු කැව නසිනේ ඔහුම ව ද
අ නි ක් ලොවින් නොනැසෙයි එකම සතෙකු ද
ප ස ක් දුදන් පබුකළුවුව ලංකළ ද
ව ග ක් නසියි එ මතුද වැනසෙයි ඔහු ද

සර්පයකු විසින් එකෙක් දෂ්ට කරන ලද නම් මරණයට පැමිණෙන්නේ ඒ දෂ්ට කරන ලද සර්පයාම වද. ලොකයෙන් අන්‍ය වූ එකම සර්පයෙකුත් නො නැසෙයි. ආධිපත්‍යයට (ස්වාමි

බවට), පත් කරන ලද දුර්ජනයා ඇතිවූයේ හෝ සමීපයෙහි නබා සෙවුනා ලද්දේ වීනම් ප්‍රත්‍යක්‍ෂයෙන් දරු මුනුබුරු ආදී වගීයක් ම නාසතී වෙයි, එපමණක් නොවෙයි, (සපීයා දඹකිරීමෙන් තෙමේ නොනස්නේ නමුත්) දුර්ජනයා තෙමේත් විනාශ වෙයි.

81 නො මි න් ලොවැ සියලු දේ දකිනා ඇස ට
ත ම න් සැටි මඳක් වත් නොපෙනෙන ලෙස ට
අ නු න් දෙස දකිති අනුවණ දන කප ට
ත ම න් සියලු දෙස නොදනිති නියම කො ට

ලොකයෙහි අප්‍රමාණ වූ සකල වස්තූන් දක්නට සමර්ථ වූ චක්‍ෂුසට තමන්ගේ රූප භෙදය (ඇසේ ආකාරය) නො පෙනෙන් නාක් මෙන් අඥාන වඩක ජනයෝ මෙරමා (අනුන්) දෙස දකින්, තමන් පිළිබඳ එකද දෙෂයකුත් නිශ්චය කොට නො දනිත්.

82 ස ලප ය තරිඳු හිමරැස වෙයි හිම ගිරි දු
ක ර ඹ ය මුහුදු දිළිඳුව ඇවිදියි කිවි දු
නි සිදෙ ය මෙබඳු උවදුරු දැරුවේය රු දු
මෙතෙදිය පසිඳු අපවගමය සුපිරිසි දු

චන්ද්‍ර තෙම (පරිශුද්ධ වංශොද්භූත නමුදු) ශශ ලාඤ්ඡන ඇත්තේ වෙයි. (නිෂ්කලඞ්ක නොවෙයි.) හිමාලය පර්වත (ශිඛර) ය තෙමේ (ඉතා උස්වූයේ නමුදු) හිම රාශියෙන් යුක්ත වෙයි. (අහස්හි මිදුණු තුෂාරයෙන් වැසීගිය බැවින් නිකෙලෙශී නොවෙයි.) සමුද්‍රය තෙමේ (ගාම්භීර්‍යයෙන් යුක්ත වූයේ නමුදු) ලවණ ජලවත් වෙයි. (මධුර නොවෙයි.) කවීන්ද්‍ර තෙමේ (පණ්ඩිත වූයේ නමුදු) බැගෑව ඇවිදිනේ වෙයි. (ධනවත් නොවෙයි.) (ලොක යෙහි උත්තම භාවයට) යොග්‍ය වූ පදවීය මෙසේ මහත් උපද්‍රව ඇති වූයේය. අතිශ්‍ය පරිශුද්ධ වූ (අනීතික වූ) වස්තුව නම් මේ ජගත්‍ත්‍රයෙහි ප්‍රසිද්ධ නිර්වාණ ධාතුව මය.

83 මැ ද හ ත් සුදනන්ගෙ විතරණ ගුණැති සො ඳ
ම ඳ ව ත් වුව ගනිති ලිඳැ දිය මෙන් පැහැ ද
නොපණත් ගුණැති දුදනන්ගේ දන නොම ඳ
නොගනිත් යදි දනෝ කරදිය මෙන් මුහු ද

ත්‍යාග ගුණයෙන් යුක්ත වූ යහපත් වූ මධ්‍යස්ථ සත්පුරුෂ යන්ගේ අල්ප වස්තුව වූයේ නමුත් ලිඳ දිය (ගන්නා) සේ (වස්තු කැමැත්තෝ) ප්‍රසන්නාව ගනිත්. අශික්ෂිත ගුණ ඇති දුර්ජනයන් ගේ අමන්ද වූ ධනය සමුද්‍රයෙහි ලවණ ජලය සෙයින් අර්ථීහු පිළිනොගෙන තබත්.

84 දි ගු න් සුදු කරන සඳ අමරැසින් යු ත
ස ස න් නො හරිනෙව කප් හිම් තමන් ග ත
අ නු න් දුකට සුදනෝ නෙක නැත් කර ත
ත ම න් ගෙ කටයුතුවට එලෙස නො ම වෙ ත

සියලු දිසාවන් ආලෝකයෙන් හෙළි කරන්නාවූ නොහොත් දිශාවන් ශුභ්‍රවර්ණයට පමුණුවන්නාවූ අමෘතරශ්මියෙන් යුක්තවූ හෙවත් සොම්ගුණවත් රැසින් යුක්තවූ චන්ද්‍රයා තමන්ගේ ශරීරයෙහි ශශලාඤ්ජනය (සා රූපය) කලපානනය දක්වා පහ නො කරන්නාක් මෙන් සජ්ජනයෝ අන්‍යයන්ගේ දුක් (දුරුතු රනු) පිණිස බොහෝ උත්සාහ කෙරෙත්, තමන්ගේ (දුඃඛ නිවාරණාදී) කර්තව්‍ය පිණිස එසේ (උත්සාහවත්) නොවෙති.

85 ව න ත් නොයෙක් ගං හෝ ඇළි කඳුරු පැ න
ම හ ත් ගැඹුරු සිදු නො යනෙව් වෙරළ පැ න
ල ද ත් මෙ මුළු දඹදිවැ රජසිරි සුද න
සි රි ත් ලෙසට පවතී උඩහු නොවම් න

බොහෝ වූ ගඞ්ගාය ඔයවල්ය ඇළිවල්ය දෙලවල්ය යන මොවුන්ගේ ජලය ප්‍රවිෂ්ට වූ නමුත් අනිගමනීර වූ සමුද්‍රය වෙරළ ඉක්මවා නොයන්නාක් මෙන් සත්පුරුෂයා මේ සකල ජම්බුද්වීප යෙහි (චක්‍රවර්තීනි) රාජ්‍යශ්‍රිය ලැබුයේ නමුත් ඔවුන්ගේ ඔද්ධත්‍යයට නො පැමිණ (ධාර්ම්මික) චාරිත්‍රයය වූ පරිද්දෙන් ප්‍රවර්තිතවෙයි.

86 පැ ණ ස ර නො වන සත නිති සුදනන් පැහැ ර
ක ර ද ර දුදන සමග වැ වෙසෙති හැම ව ර
ම න හ ර ගජකුඹින් මුත් දිමුතු මුතු හැ ර
උ ර ස ර සන උනිඳ බිජු වැනි වැසි සබ ර

ප්‍රඥාසාර නොවන තැනැත්තෝ සත්පුරුෂයන් පිළිකෙව කොට (ඉවත් කොට) දුර්ජනයන් හා එක් ව ආදර පවත්වමින් වාසය කෙරෙති, කෙසේද යත්:— ගජකුම්භයෙන් ගිලිහුණු මනොහර දිප්තිමත් (නාග) මුක්තාඵලයන් (ගජමුතු) පිළිකෙව් කොට වැදි ජනයා ඔලිඳඇටවලින් වක්‍රාස්ඵලයන් සරසන්නාක් මෙනි.

87 සො ඳු රු ගුණ නුවණ යුතු උතුමෝ පත ර
න පු රු දුදන සහ එක් වුව වෙති අස ර
රු දු රු කටු පහණ නැති සමතල හස ර
අ ඳු රු සමග වූ කලැ වෙය බියක ර

සඟපත් ගුණනුවණින් යුක්ත වූ උත්තමයෝ (පවා) දුර්ජනයන්

සමඟ එක් වුව හොත් අසාර බවට (හෙළා දැක්ක යුතු බවට) පැමිණෙති. ඒ එසේ මැයි:— කණ්ටකපාෂාණ විනිර්මුක්ත වූ (කටු හා ගල් නැත්තාවූ) සමතලා මාර්ගය (පවා) තිමිර සමපක්ෂය (අඳුරු හා එක් වීම) ඇති වූ කල භය උපදවන්නේ වෙයි.

88 තිරසර ගුණැති සුදනෝ පර වැඩ නැති ද
වරසුර පුරෙහි වත් නො වසති නිරය ලෙ ද
ගොරතර නිරෙහි වත් අනුනට වැඩ ඇති ද
සුරපුර ලෙසට හැසිරෙත් සුදනෝ පබ ද

ස්ථිරසාර ගුණයෙන් යුක්තවූ සත්පුරුෂයෝ උතුම් දිව්‍ය පුරයෙහි වුවත් පරාජිකරණයෙහි නියුක්ත වීමෙක් තමන්ට නොමැත්තේ නම් (පරහිතප්‍රතිපත්තිය නැති බැවින්) නිරය මෙන් (සලකා ඉවත් ව යෙති) නො නවතිති, ගොරතර අපාය යෙහි වුවත් ඒ අන්‍යයන්ට (තමන්ගෙන් කටයුතු) අභිවෘද්ධියක් ඇත්තේ වී නම් ප්‍රසිද්ධ වූ සජ්ජනයෝ (එබඳු අපාය පවා) සුර පුර මෙන් (සලකා පරනට වැඩ පිණිස) හැසිරෙත්.

89 පහනින් පහන් සියගණනක් ඇවුළුව ද
එ පහන් සිළෙහි අලු අඩු නොවැ දිලෙන ලෙ ද
ලොව අන් සතුන් ගුණ පළ කරමින් නිබ ද
සු පසන් ගුණෙන් වැජඹෙති සුදනෝ පබ ද

එක් ප්‍රදීපයකින් අන්‍ය වූ ප්‍රදීප සිගණනක් දැල්වූයේ නමුත් ඒ ප්‍රදීපශිඛාවගේ ආලෝකය(අන්‍යයන්ට දුන් බැවිනැයි) ඌනත්වය කට නො පැමිණ බබළන්නා සේ ලොකයෙහි අන්‍ය සත්වයන්ගේ ගුණ නිරන්තරයෙන් ප්‍රකාශ කෙරෙමින් ප්‍රසිද්ධ සත්පුරුෂයෝ සුප්‍රසන්නාගුණයෙන් විජෘම්භමාන වෙති (බබලමින් පවතිත්.)

90 ගජ කුම් බිඳින එකසර කෙසරිඳු බලැ නි
කොතර ම් සා වුවත් තණ කබල නුබුදි නි
වි ගි ගු ම් කුලෙන් යුතු උතුමෝ අබි මනැ නි
දි වි ගි ම් කොටත් නො තරම් කම් නො ම කෙරෙ නි

හස්තිකුම්භයන් විදාරණය කරන්නාවූ බලවත් වූ එකචාරී වූ (තනිව හැසිරෙන) සිංහරාජයෝ කො පමණ ක්ෂුධාපීඩනය (බඩගිනි වෙහෙස) ඇති වූ නමුත් තෘණ කබලිංකාරාහාරය අනුභව නො කෙරෙති. (එසේම) උත්තමවංශ ඇත්තා වූ අභිමාන ඇත්

නා වූ උත්තමයෝ ජීවිතාන්තය දක්වාත් (කුලයට) නො ඔබන (නිඝිත) ක්‍රියා නො කෙරෙත්මය.*

"ගජකුම්භ+බිඳින" යි තුබූ තන්හි උකාර සහිත බකාරයාහට ලොප් හා අතිරික්ත මකාරාඛ්‍යයහට මාත්‍රාවෘඩි ද කොට ගාත්‍රාක්ෂර ලොපවිධියෙන් ගළපන ලදී.

91 බ ල යු ත් තුමුල මත වරණිදු මෙදෙනැවි ස
දි ව ත ත් සෙද තමන් සොඬ නො මඩින විලු ස
ල දු ව ත් නැණැති දන මුළුලොවැ ඉසුරු රැ ස
නොපණත් දෙයක් නො කෙරෙති නිසි දේම මි ස

කායබලයෙන් යුක්ත වූ මහත් ශරීරයක් ඇත්තාවූ මත්ත හස්ති රාජයා රාග මදයෙන් කුපිතව ශීඝ්‍රව දිවන්නේ නමුත් තමාගේ සොඬ ආක්‍රමණය (තැළීම) නො කරන්නාක් මෙන් ගුණ වන්ත ජනයෝ සකල ලොකයෙහි ඓශ්වර්‍ය්‍ය රාශිය ලැබුවාහු නමුත් (උත්තමයන්ට) යෝග්‍ය වූ ක්‍රියා මැ විනා අව්‍යවස්ථිත වූ (නීතියට විරුඬ වූ අධර්ම) ක්‍රියාවක් නො කෙරෙත්.

92 ප ස ක් මුනිදු සමයම නොගෙහැ සුනිම ල
අ නි ක් කුදිටු ගෙනැ ලෙව් සත නැණ විත ල
එමො ක් පුරට පැමිණෙත යම් කල එක ල
අ දෙ ක් දුක්ක ගෙයි විපදය එ නුබ ත ල

සර්ව්වඥයන් වහන්සේගේ අති නිර්මල වූ ප්‍රත්‍යක්ෂ වූ ධර්මය මැ පිළි නො ගෙන ඥානයෙන් විකල වූ ලොක සත්වයා අන්‍ය වූ

---

* කබල නම්:- (කබලිංකාරාහාර ඵස්සාහාර විඤ්ඤාණාහාර මනොසඤ්චෙතනිකාහාර යන චතුර්විධ ආහාරයන් අතුරෙන්) කබලිංකාර නම් ආහාරඛයි. ඔජස අට වැනි කොට ඇති ධාතු රූපයන් නිර්මිත කරන ආහාරයයි කියන ලදි. (කබලිංකාර ශබ්දයෙන් පිඩුකොට ගැනීම් අර්ථයද කියත්.) මනුෂ්‍ය සිංහ ගව සර්ප යන මේ ආදිහු ප්‍රාණ බලය පැවැත්වීම පිණිස බත් මස් තණ මැඩි යනාදි යම් ආහාරයක් ගනිත් නම් ඒ වනාහි මේ කබලග්‍රාසයයි.

යාය ඔජාය යාපෙන්ති
යඤ්ච යඤ්ච පාණිනො
අයන්තු කබලිංකාරො
ආහාරොති පවුච්චති.

මිථ්‍යා දෘෂ්ටික ධර්මයන් ග්‍රහණය කොට යම් කලෙක්හි ඒ නිර්වාණ පුරයට පැමිණෙත හොත් එකල්හි පක්ෂීන්ගේ පාද ලාඤ්ඡනය න්හස් සටලයෙහි දක්නට අඩියෙක් (පවා) සමර්ථ වෙයි.

93 න ඳ න ගුණ නුවණ යුතු උතුමෝ මහ ත
නොගෙන කිසි කරුණු සත සුවපත් කර ත
දි ලේ න සා මඩුලු යුතු තුරුපෙළ දිමු ත
ය නෙ න සත සතපමින් ගිම් දුර හරි ත

සතුටු එළවන ගුණ නුවණින් යුක්ත වූ පූජ්‍ය වූ උත්තමයෝ කිසිත් ප්‍රති වස්තුවක් නොගෙන ලොක සත්වයා සැපයට පත් කෙරෙති. ඒ එසේමැයි:- ශාඛා මණ්ඩලයෙන් යුක්ත වූ වෘක්ෂ පඩක්තිහු යන එන්නාවූ සත්වයන් සන්තර්පණය කෙරෙමින් ග්‍රීෂ්මය දුරු කෙරෙත්.

94 ඉ සු රෙ න් රුවින් සරි අය වෙසෙතත් නොම ඳ
කුළුණෙ න් ලොව රැකි එක් උතුමෙක් පබ ඳ
මැ ඩි ය න් බුදින නා කැල ඇති ව ද විස ද
ද ර ම් න් දෙරණ සිටිනේ නත නා ම ව ද

ඖශධයක්‍ෂයෙන්ද රූපසෞන්දර්‍යයෙන්ද සමාන අය බොහෝ සේ සිටිතත් කරුණාවෙන් ලෝක සත්වයා රක්ෂා කරන්නේ ප්‍රසිද්ධවූ (විශිෂ්ටවූ) එක් උත්තමයෙකි. මණ්ඩූකයන් ගොදුරු කොට ගන්නාවූ විෂ පතුරුවන් නාග සමූහයා ඇත්තේ විනමුත් පෘථිවිය උසුලා සිටින්නේ අනන්ත නම් නාගයා ම වද?

95 තැන තැන නිදන් කොට නො තබා හැම දින ම
කව බොව යදින්හට දන් දෙව වඩා ලෙප ම
මිහි බැඳි බිහුන්හට වන ලෙස දුක දුහ ම
තව නව් ලොබින් දන රැස් කොට තබනු කි ම

(තමන් සන්තක ධනය) තැනින් තැන නිධාන කොට නො තබා කෑමෙන් පීමෙන් (දුහැමින්) සැප විඳුව. යාචකයන් ට ප්‍රෙම වඩනය කොට දානප්‍රදානය කරව. මි බැන්දවූ මි මැසි සමූහයාහට (සතුරන් විසින් වස්තු පැහැර ගැන්මෙන් ව්‍යසන ප්‍රාප්තිය) වන ලීලාව දකිමින් ම නැවත නැවතත් ලොභයෙන් ධන සඤ්චය කොට තබන්නේ කුමට ද?

96 නි ති න් දුදන සමග වැ සුදන විසුව ද
ප ස න් ගුණෙන් ලොවැ සතහට වෙති සුහ ද
රි වු න් විමන ඇති වුණු කොවුලන්ගෙ න ද
ඇ ස න් නවුන් යුග සවනට මිහිරි ව ද

සතපුරුෂයෝ දුර්ජනයන් හා සමග නිතර වාසය කළත් ප්‍රසන්න ගුණයෙන් ලොක සත්වයාහට මිත්‍ර වෙති. ඒ එසේ මැයි:- අරිෂ්ටයන්ගේ විමානයෙහි (කුවුඩු කැදැල්ලෙහි) වැඩුණු වූ කොකිල පක්ෂීන්ගේ නාදය ශ්‍රවණය කරන්නාවුන්ගේ කණ් යුගමයට මධුර නාද කොට පවත්නේ වේද?

97 නො මි න් මහ පිනැතියෙක් පසිඳු මෙදිය ත
කු ලෙ න් අඩු වැ උපනත් ලොව නැණැති ස ත
නො සි න් අදර බුහුමන් වඩමින් පුද ත
ම ඩි න් උපන් ඉඳුවර පලදිනෙව ම ත

මේ ලොකයෙහි ප්‍රසිද්ධ වූ අප්‍රමාණ මහපින් ඇති තැනැත්තෙක් කුලයෙන් හීන ව උපන්නේ වී නමුත් ගුණවන්ත ජනයෝ ආදර බහු මාන වඩන කෙරෙමින් (ඒ හීන කුලික පින්වත් හට) පූජා කෙරෙත්. කෙසේදයත්:- කදිමයෙන් උපන් ඉන්දීවර පුෂ්පය (මහනෙල් මල) මස්තකයෙහි පලදින්නාක් මෙනි.

98 බු දි ත් මියුරු මී අඹ රසය සනොසි න
ගු දි ත් සොඳුරු ගෙවුයන්වල තුරු මුදු න
සිරි ත් මෙ ඈ කරතත් කොවුලන් ලෙසි න
ව ස ත් කලැ දැනෙයි රිටු පරපුටු නදි න

ස සැත්තෑ වන පද්‍යයෙහි මේ අර්ථය කියන ලදි.

99 නෙ ක ර ජ සිරින් සුරිඳුට සියගුණෙන් වැ ඩි
රු පු ර ජ ගජන් එකසර කෙසර ලෙස මැ ඩි
දි න ර ජ කුල පහගැ බැදි මහතු රන්කො ඩි
සි රි ර ජ සිහ රජුගෙ සිරිපද සෙවණැ වැ ඩි

අනෙක රාජ්‍යශ්‍රී කරණ කොට ශක්‍රදෙවයාහට ශතගුණයෙන් අධික වූ ශත්‍රු රාජ නමැති හස්තීන් එකවර (තනිව හැසිරෙන බැවින් ප්‍රචණ්ඩ වූ) සිංහයකු විසින් මෙන් මර්දන කළා වූ සූර්‍ය්‍ය වංශ නමැති ප්‍රාසාදයාගේ මුදුනෙහි නහන ලද මහාර්ඝ වූ රන් කොඩියක් වැනි ශ්‍රී රාජසිංහ රාජයාගේ ශ්‍රී පාදච්ඡායාවෙහි වර්ධිතවූ (එකවාක්‍යතාපන්න කොට පද්‍යත්‍රයක් රචනා කෙරෙත්.)

100 පි ජ ම් පෙළ සයුර සැදි මොක් වෙරලනි න
සි යු ම් නියතලෙන් ගත් කුඹුයොන් සිරි න
උ තු ම් හිස්වැල්ල නම් ගම හිමි සොබ න
ද හ ම් දජ නැමති පඬිවරහට නඳ න

මොක්ෂ නමැති වෙලාන්තයෙන් සජිත වූ අභිධර්ම පාලි නමැති සාගරය අගස්ත්‍යමුනිහු සෙයින් නිඝණ්ඨු නමැති හස්තතලයෙන් ගත්තාවූ හෙවත් අති ගම්භීර පරමාර්ථ ධර්ම සංඛ්‍යාත අභිධර්ම්පාලිය නිර්ශෙෂයෙන් අවබොධ කළාවූ හිස් වැල්ල යන නම් ඇති උතුම් ග්‍රාමයහට ස්වාමි වූ ශොභන වූ ධර්මධ්වජ යන නම් ඇත්තාවූ පණ්ඩිතොත්තමයාහට පුත්‍ර වූ.

101 නි ති සු ප ස න් න සරසවි රැඳි මුව තඹ ර
කි වි ග ජ බි න් න කළ එකසර කෙසර යු ර
අ ල ගි ය ව ණ් න මුකවෙටි නමැති කිවිය ර.
සු තු ප ද ස න් න මේ කවි කෙළෙය අම යු ර

නිරන්තරයෙන් අති ප්‍රසන්න වූ සරස්වති දෙවිය මුහුණ නමැති තාමරසයෙහි වාසය කළාවූ කවිජන හස්තීන් හිනා කළ එකවර කෙශරයකු වැනි වූ අලගිය වන්න මුකවෙටි යන නම් ඇති කාව්‍යකාර තෙමේ (පෞරාණිකයන්ගේ) පද්‍යයන්ට සන්තයක් වැනි වූ අමෘතාකාර වූ මේ සුභාෂිත කාව්‍යය රචනා කෙළේයි.

— නි මි. —